**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය**

**විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

**--------------------------------------------------------------------------------**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/ **කච්චේරියේ** ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

**---------------------------------------------------------------------------**

(අ) ඩෙල්ෆ්ට්

(ආ) වේලනෙයි

(ඇ) කරෙයිනගර්

(ඈ) කයිට්ස්

(ඉ) යාපනය

(ඊ) නල්ලූර්

(උ) වලිකාමම් නිරිත

(ඌ) වලිකාමම් බටහිර

(එ) වලිකාමම් දකුණ

(ඒ) වලිකාමම් උතුර

(ඔ) වලිකාමම් නැගෙනහිර

(ඕ) තෙන්මාරච්චි

(ක) වඩමාරච්චි නිරිත

(ග) වඩමාරච්චි උතුර

(ජ) වඩමාරච්චි නැගෙනහිර

**1.1 විෂය පථය**

**-------------**

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 26 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම්

### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 550.65 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 547.89 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 2.76 ක් හෙවත් සියයට 0.5 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 517.65 | 515.01 | 2.64 | 0.51 |
| මූලධන | 33.00 | 32.88 | 0.12 | 0.36 |
| | | | | 0.51 |
| එකතුව | 550.65 | 547.89 | 2.76 | |

### (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් එකතුව රු.මිලියන 4,958.97 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර ඉන් රු. මිලියන 4,108.96 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව, ඉතිරිය ලබා දී තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 850.01 ක් හෝ සියයට 17.14 ක් වී තිබුණි.

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම |  | ලැබීම |  | හර ශේෂය |  |
|---|---|---|---|---|---|---|
|  | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
|  | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 26401 | 35.00 | 34.88 | 25.00 | 31.12 | 110.00 | 106.65 |

**2.2.2 අග්‍රිම ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට ගිණුම් අංක 7002/0000/00/0282/0014 දරන **අග්‍රිම ගිණුම**ේ ශේෂය රු.421,770 ක් විය.

2.3 **පොදු තැන්පත් ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් අංක 6003/0000/00/0040/0000/000 ට අදාල තැන්පත් ගිණුමේ ශේෂය රු. 103,405,228 ක් විය.

2.4 **විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.11 ඡේදවල දක්වා ඇත.

## 3 ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය

-----------------------------------------------------------------------

### 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආදායම් ගිණුම් 2015 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් එම ගිණුම් 2015 ඔක්තෝබර් 25 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

----------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
| --- | --- | --- |
| උපපත්‍රිකා පොත් ලේඛණය | 5:10 කච්චේරි මාර්ගෝපදේශක අත්පොත | පවත්වා නොතිබුණි |
| පොත් නාමාවලිය | 5:9 කච්චේරි මාර්ගෝපදේශක අත්පොත | පවත්වා නොතිබුණි |
| දුරකථන ලේඛණය | මුදල් රෙගුලාසි 846(3) හා 845(1) | යාවත්කාලීන කර නොතිබුණි |
| පරිපූරක ලේඛණය | මුදල් රෙගුලාසි533 | යාවත්කාලීන කර නොතිබුණි |
| වාහන දෛනික ධාවන සටහන්පත් | මුදල් රෙගුලාසි 1646 හා 1647 | වෙන් කළ වාහන සඳහා පවත්වා නොතිබුණි |
| ස්ථාවර වතක්ම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| පරිගණක, උපාංග හා මෘදුකාංග සඳහා වන ස්ථාවර වත්කම් ලේඛණය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |

**3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-----------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක එකතුව රු.14,525,362 ක් වූ ගනුදෙනු 343 ක් වැඩ නිමකළ වාර්තා, මිල ගණන්, ප්‍රසම්පාදන තීරණ, ඉන්වොයිසි, ලදුපත්, ඉන්වෙන්ට්‍රි සහතික, අමතර ඉන්ධන අනුමත කරගැනීම්, අනුමත කිරීමේ ලිපි යනාදිය නොලැබීම මත සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**3.4 විසර්ජන ගිණුම**

**-------------------**

**3.4.1 අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයවැය ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 55.16 ක් වැය කර තිබුණි. මෙලෙස අයවැය ප්‍රතිපාදන ඉක්මවා අතිර්ක වියදම් දැරීම සම්බන්ධයෙන් පරිපූරක ප්‍රතිපාදන/මුදල් රෙගුලාසි 66 සහ 69 ප්‍රකාර ගැලපීම් කිරීමට ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අධිකාරි බලය ලබාගෙන නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම් සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 3 ක් වූ ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුව යටතේ අනුමත නොකළ යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. මේ පිළිබඳව තවදුරටත් නිරීක්ෂණය කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු නිම කිරීමට ප්‍රථම වෙන් කරනු ලැබූ රු.මිලියන 3 ක් වූ මුදල කිසිදු අනුමැතියකින් තොරව යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු සඳහා මාරු කර තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 5 ක් සඳහා සත්‍ය වශයෙන්ම වෙන්කර තිබූ රු.3,534,503 ක් වූ ප්‍රතිපාදන අවස්ථා 5 ක දී සියයට 09 සිට සියයට 62.3 ක් දක්වා අඩුකර තිබුණු අතර වෙනත් පුනරාවර්තන ප්‍රතිපාදන 4 ක් සියයට 11.5 සිට සියයට 25.7 ක් දක්වා වැඩිකර තිබුණි. විධිමත් මූල්‍ය පාලනයකින් තොරව මෙම වියදම් ඇස්තමේන්තු පිළියෙල කර ඇති බව මේ අනුව පෙනී යයි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 9 ක් අතර ඉතිරි වීම් සියයට 9 සිට සියයට 60 දක්වා පරාසයක පැවති අතර එකතුව රු.4,682,338 ක මෙම ඉතිරිය සඳහා සැහීමකට පත්විය හැකි හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

### 3.4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

-----------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන යටතේ රු.3,299,259 කට තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 නොවැම්බර් 14 දින මහන මැෂින් 141 ක් මිලදී ගනු ලැබූ අතර මෙම මිලදී ගැනීම දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටු තීරණයට පටහැනිව සිදුකර තිබුණි. මේ සඳහා සැපයුම්කරුට රු. 479,400ක මුදලක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

### 3.5 අග්‍රිම ගිණුම්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිම කළ වහාම ලබාගත් අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 5 කදී ලබාගත් අතුරු අග්‍රිම එකතුව රු.65,657 ක් අදාල කාර්යය නිම වී මාස 01 සිට මාස 2 ½ ක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

(ආ) විධිමත් අනුමැතියකින් තොරව රු.7,500 ක සීමාව ඉක්මවා රු.10,000 ක සුළු මුදල් අග්‍රිම නිකුත් කර තිබුණි.

### 3.6 පොදු තැන්පත් ගිණුම

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ රු.7,185,120 ක් වූ තැන්පතු 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) තැන්පත් ගිණුමේ ඇති වසරකට වඩා වැඩි කොන්ත්‍රාත් වැඩ 57 ක රඳවා ගැනීමේ මුදල් රු.2,948,316 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල පොදු තැන්පත් ගිණුමේ මාස 3 කට අධික කාලයක් රඳවාගෙන තිබූ නොගෙවූ පාරිතෝෂිත මුදල් රු.228,521 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඇති රු.252,188 ක නොගෙවූ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) යතුරු පැදි ලබාදී තිබූ ක්ෂේත්‍ර රාජකාරියේ නිරත නිලධාරීන්ගෙන් රැස් කරනු ලැබූ වටිනාකම රු.5,255,000 ක මුදල්, 2014 ජූලි 23 දිනැති අංක 2/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර ආදායම් ගිණුමට ගිණුම්ගත නොකර තැන්පත් ගිණුමේ තබා තිබුණි.

(ඊ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.18,039,225 ක මුදල් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ තබා තිබුණි.

(උ) සේවක වැටුප්, ප්‍රසාද දීමනා, අතිකාල, විදුලිය වියදම්, ගමන් වියදම් සහ දුරකථන ගාස්තු යනාදිය වෙනුවෙන් දරන ලද රු.4,599,948 ක වියදම්වලින් පසුව රු.24,597,105 ක් වූ මාර්ග බලපත්‍ර මඟින් රැස් කරනු ලැබූ මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබූ අතර, 2003 මැයි 07 දිනැති අංක NTC/POL/98/22 දරන ජාතික ගමනාගමන කොමිසමේ ලිපිය ප්‍රකාර ආදායම් ගිණුමට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඌ) සැලසුම් කාර්යාල තැන්පත් ගිණුම - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

පහත සඳහන් තොරතුරු විගණනය සඳහා ඉල්ලා ඇති නමුත් 2015 සැප්තැම්බර් 07 දින වන විටත් ලබා දී නොතිබුණි. මේ හේතුවෙන් පහත සඳහන් ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(i) 2013 ජනවාරි 01 දිනට පොදු තැන්පත් ලෙජරයේ දක්නට ලැබු රු.8,993,916ක තැන්පත් ගිණුම් ශේෂයේ විස්තර CIGAS මුද්‍රිත පිටපත්වල සඳහන්ව නොතිබුණි.

(ii) ඉහත තැන්පත් ගිණුම මඟින් යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාල තැන්පත් ගිණුමට 2013 දෙසැම්බර් 31 දින මාරු කළ බවට සඳහන් වූ රු.803,977 ක ශේෂය පිළිබඳ විස්තර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පොදු තැන්පත් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(iii) අයකරන ලද මුද්දර ගාස්තු සහ උපයන විට ගෙවීම් බදු (PAYE) මුදල් රුපියල් 96,151 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර මාස 03 කට අධික කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි.

**3.7 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**-----------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනටවිෂය අංක 26401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සේවය හැර ගිය, විශ්‍රාම ගිය සහ විනය ක්‍රියාමාර්ගවලට යටත් වූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.442,823 ක ශේෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව අයකර ගැනීමට හෝ ගැලපීම් (adjustment) කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තුන් දෙනෙකුගෙන් අයවිය යුතු දේපළ ණය හා ආපදා ණය ශේෂ එකතුව රු.1,796,306 ක් සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) අග්‍රිම මුදල් ලබා ගැනීමෙන් තොරව රු.17,139,076 ක ණය ගෙවා තිබුණි.

**3.8 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**-----------------------------------**

**3.8.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**----------------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර වර්ෂය ආරම්භයේදී අනුමත කර නොතිබුණි.

**3.8.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------------**

2014 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළ වාර්ෂිත ප්‍රසම්පාදන සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**3.9 වත්කම් කළමනාකරණය**

------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂවේදී අනාවරණය වූ අඩුපාඩු දැක්වේ.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-----------------------------------------**

(i) සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් අනාවරණය කරන ලද අතිරික්තතා, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පත් කරන ලද සමීක්ෂණ මණ්ඩලය, ග්‍රාම නිලධාරි කාර්යාලවල ගබඩා 435 ක වාර්ෂික සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි.

(iii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 කට අයත් ග්‍රාම නිලධාරී කාර්යාලවල පැවති ගබඩා අයිතම් 231 ක් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් විසින් මුදල් රෙගුලාසි 756(2) හි විධි විධානවලට පටහැනිව සමීක්ෂණ කටයුතු සිදුකර තිබුණි.

(iv) යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිල වාහන 48 ක වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමට ගෙන නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

2013 වර්ෂයේදී ඉදිකරන ලද කරෙයි නගර් ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල පෞද්ගලික ඉඩමක පිහිටා තිබූ අතර මෙහි හිමිකාරීත්වය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නොවීය. මෙම ඉඩමෙහි හිමිකාරිත්වය වෙනස් කර ගැනීම සම්බන්ධයෙන් මෙම වාර්තා කරන දින දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, මෙම ගොඩනැගිල්ලෙහි 2014 දෙසැම්බර් 31 දිනට වූ ඓතිහාසික පිරිවැය/ පොත් අගය පරික්ෂා කිරීම සඳහා සම්බන්ධිත ලිපිගොනුව විගණනය වෙත ඉදිරිපත් නොකරන ලදී.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයට අඩු බැරකම් වටිනාකම රු.1,787,013 ක් විය. කෙසේ වුවද, මුදල් රෙගුලාසි 94(2) ට පටහැනිව බැරකම්වලට එළඹ නොතිබුණි.

**3.10 අනුකුල නොවීම්**

**නීතී, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරික්ෂණවලදි නිරික්ෂණය වු නීතී, රීති හා රෙගුලාසිවලට අනුකුල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීතී,රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| | (i) මුදල් රෙගුලාසි 94 | 1,787,013 | බැරකම් සඳහා ස්වාධීන සනාථ කිරීම් ලබාගෙන නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 115 | 80,890 | පසුගිය වර්ෂය වෙනුවෙන් එළඹ තිබූ වියදම් සඳහා අධිකාරි බලය ලබාගෙන නොතිබුණි. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | (i)1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 39 ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු වාහන 14 ක ඉන්ධන පරිභෝජනය පිළිබඳ සෑම මාස 06 කට වරක් ම පරීක්ෂා කර නොතිබුණි. |
| | (ii)2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය | 3,629,762 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක වෙන් කළ වාහනවල දෛනික ධාවන සටහන් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ)** | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| | 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන චක්‍රලේඛය | | සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

## 3.11 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර දැමීම සහ ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) **<u>ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර දැමීම.</u>**

පහත සඳහන් ව්‍යාපෘති දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | නිම කළ යුතු දිනය | ආරම්භ නොකිරීමට හේතු (කෙටියෙන්) |
|---|---|---|---|
| | රු. | | |
| පිරිමි නේවාසිකාගාරය ඉදිකිරීම | 5,000,000 | 2014 | ප්‍රතිපාදන ඉවත් කර ගැනීම |
| කාන්තා නේවාසිකාගාර ඉදිකිරීම | 5,000,000 | 2014 | ප්‍රතිපාදන ඉවත් කර ගැනීම |

(ආ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිකරන ලද මහල් හතරකින් යුක්ත පරිපාලන ගොඩනැගිල්ල ඉටු කිරීම් ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ අදියර V සඳහා රු. මිලියන 12 ක් ඇස්තමේන්තු කර 2014 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එහිභෞතික ප්‍රගතිය සියයට 60 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. මේ සම්බන්ධයෙන් සැලකිය යුතු කාල ප්‍රමාදයක් විගණනයේදී නිරීක්ෂණය විය. 2011 වර්ෂයේදී මෙම ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කරනු ලැබූ අතර එය ඇරඹූ වර්ෂයේ සිට රු.මිලියන 53.69 ක මුදල් වෙන්කර තිබූ අතර ඉන් මෙම වාර්තාවේ දින වන විට ඉන් රු.මිලියන 53.65 ක් වැය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වර්ෂය** | **වෙන් කළ මුදල** | **වියදම** |
|---|---|---|
| | **රු.** | **රු.** |
| 2011 | 19,500,000 | 19,500,000 |
| 2012 | 5,000,000 | 4,958,478 |
| 2013 | 17,192,000 | 17,192,000 |
| 2014 | 12,000,000 | 12,000,000 |
| | 53,692,000 | 53,650,478 |

**3.12** **කාර්යසාධනය**

-------------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රමාණවත් ලෙස ඉටු නො කර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහතින් දැක්වේ.

(i) රජයේ නිලධාරීන් තම තනතුරට උචිත ලෙස සකස් වූ මධ්‍ය කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(ii) ආපදා කළමනාකරණ සේවා ඒකකය විසින් ගම් මට්ටමින් කමිටු ස්ථාපිත කිරීම.

**3.13** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ වලිකාවම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත බයිසිකල් හා යතුරුපැදිවලින් පැමිණෙන ජනතාවගෙන් රු.2.00 සිට රු.10 දක්වා වූ වාහන නැවතුම් කුලියක් අය කිරීම සඳහා සේවක සුභ සාධන සංගම් විසින් අනවසර පුද්ගලයින් පත්කර ගනිමින් වසර 1 ½ කට වැඩි කාලයක සිට මෙලෙස මුදල් අයකර ගැනීමට ඉඩ සලසා තිබුණි.

**3.14** **අවිධිමත් ගනුදෙනු**

---------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු ඇතැම් ගනුදෙනු විධිමත් බවින් තොර විය. එලෙස නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහතින් දැක්වේ.

<u>අධිකාරි බලය නොමැති ගනුදෙනු</u>

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු නෙස්ටි සහ නෙස්ටි කොප්ප සඳහා වැයකර තිබුණු රු.78,995 ක මුදල සඳහා ඇස්තමේන්තු මඟින් මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර සුභසාධක කටයුතු වැඩසටහන් විෂයට අයකර තිබුණි.

(ii) නිලධාරීන්ගේ ජංගම හා නිවාස දුරකථන ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමේදී 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව ප්‍රමාද පොළී ගාස්තු, ණය හුවමාරු කිරීම්/ දුරකථන ණය පහසුකම්, ජාත්‍යන්තර ඍජු ඇමතුම් (IDD), IDD බඳු සහන සලසා ඇති සීමාව ඉක්මවා දුරකථන භාවිතය වෙනුවෙන් රු.50,772 ක් ලබාගෙන තිබුණි.

(iii) <u>වෙන්කළ වාහනයක් සඳහා අමතර ඉන්ධන ලබා ගැනීම</u>

දිස්ත්‍රික් ලේකම්වරයාට නිල වාහනයක් වෙන්කර ඇති අතර ඒ සඳහා මාසික ඉන්ධන දීමනාව රු.27,360 ක් ද ලබා දී තිබූ අතර මෙයට අමතරව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් සහ රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් පිළිවෙලින් රු.102,060 ක් වටිනාකමැති ඉන්ධන ලීටර් 849 ක් සහ වටිනාකම රු.198,394 ක් ඉන්ධන ලීටර් 1645 ක් සඳහා 2008 ජූනි 28 මෙම දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර අදාල ලේකම්වරුන්ගේ විධිමත් අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

## 3.15 පාඩු හා හානි

-------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විවිධ වූ කරුණු හේතුවෙන් වසර 13 සිට වසර 27 ක් දක්වා වූ කාලයක් රු.2,403,388 ක මුදලක් පාඩු ලෙස විසර්ජන ගිණුම්වල පෙන්වා තිබුණි. මෙය නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.16 විසඳා නොතිබුණු විගණන ඡේද

----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාලර්යාලයට අදාලව විගණකාධිපති වාර්කාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලට පසු විපරම් කටයුතු නිම නොකළ ඡේදවලට අදාල යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2013 | 1.14 | දිස්ත්‍රික් ලේකම්වරයා ඇතුළු නිලධාරීන් 27 දෙනෙකු සඳහා පුද්ගලික මඟී නාවුක සේවා කටයුතුවල නිරත වීම හේතුවෙන් ප්‍රසාද දීමනා ලෙස 2012 මැයි 02 දින රු.මිලියන 3.425 ක මුදලක් ගෙවා තිබුණි. 2009 මාර්තු මස වන විට මෙම නාවුක මඟී සේවාව නවතා දමා තිබුණද ඒ වන විටත් වැටුප්, අතිකාල හා වෙනත් දීමනාවලට අමතරව දිනකට රු.500 බැගින් ගෙවා තිබුණද මෙම නාවුක සේවා කටයුතුවලට අදාලව විශේෂ වූ කාර්යයක් කිසිදු නිලධාරියෙකු විසින් 2012 වර්ෂයේදි ඉටුකර නොතිබුණි. කෙසේ වුවද, 2015 ජූනි 29 දින සිට 2015 ඔක්තෝබර් 21 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.648,200ක මුදලක් පමණක් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හැකිවී ඇත. |
| 2011 | 1.11 (ආ) (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව සිවිල් ඉංජිනේරුවරයෙකු සේවයේ යෙදී සිටියදී 2013 ජූනි 10 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ නිරිදේශ මත සම්මන්ත්‍රන ශාලාව අධීක්ෂණය සහ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත බාහිර නිලධාරීන් සේවයේ යොදවා ඇති අතර ඒ සඳහා පොදු තැන්පත් ගිණුමෙන් රු.180,000 ක් ගෙවා තිබුණි. මේ සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3.14 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 46 | 46 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 28 | 18 | 10 | - |
| (iii) | ද්විතියික මට්ටම | 790 | 871 | - | 81 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 198 | 197 | 01 | |
| | **එකතුව** | **1,062** | **1,132** | **11** | **81** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 11 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ii) සංවර්ධන නිලධාරීන් සහ කළමනාකාර සහකාර නිලධාරීන් ලෙස බඳවාගෙන තිබූ අතිරික්ත සේවක සංඛ්‍යාව 81 ක් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධිමත් අනුමැතිය ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.